ස/අධි/5/6/2/සමි.බල.

2013/06/12

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
සහකාර සමෘද්ධි කොමසාරිස්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරී,
ප්‍රාදේශිය ලේකම්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ

**සමෘද්ධි බැංකු සංගම් විසින් මෙහෙයුම් උපදෙස් වලට පරිබාහිරව අවිධිමත් ආකාරයට ගිණුම් විවෘත කිරිම, සමෘද්ධි ගම්මාන සමිති/බලකා මුදල් අයථා පරිහරණය.**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් නිකුත් කල මෙහෙයුම් උපදෙස්, චක්‍ර ලේඛ ලිපි හා අභ්‍යන්තර මඟපෙන්වීම් වලට පරිබාහිරව පහත සඳහන් පරිදි සමෘද්ධි බැංකු සංගම් හා මහා සංගම් කටයුතු කරන බවට වාර්තා වී ඇත. දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරමින් සිටින මෙම අවස්ථාවේ මෙහි සඳහන් කරුණු පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමු.

**01. පොදු ලෙජරයේ පුද්ගලික ලෙජර්හි අවිධිමත් ආකාරයේ ගිණුම් විවෘත කොට, මුදල් රැස්කිරිම, නැවත එම මුදල් ආපසු ලබා ගැනීම සහ එම මුදල් විනිවිදභාවයකින් තොරව වියදම් කිරීම.**

1.1. සමෘද්ධි බැංකු සංගමයක ගිණුම් සටහන් තැබිය හැකි වන්නේ ලබාදී ඇති මෙහෙයුම් උපදෙස් වලට අනුකූලව පමණි. එසේම එම ගිණුම් වලට මුදල් රැස්කිරීමත් , එම මුදල් නැවත ලබා ගැනීමත්, මෙහෙයුම් උපදෙස් වලට අනුකූල විය යුතුය.

1.2. බැංකු සංගමය වෙනුවෙන් ලැබෙන ආදායම් හා වැයකරන වියදම් පොදු ලෙජරයේ කේත අංක සමඟ හඳුන්වා දී ඇති ආදායම් හා වියදම් ගිණුම් ඔස්සේ පමණක් සටහන් තැබිය යුතු වේ.

1.3. මෙම සියළු වියදම් දැරීම සඳහා කළමණාකරුට මෙහෙයුම් උපදෙස් මඟින් ලබාදී ඇති බලතල සීමාව තුල පමණක් සිදුවිය යුතු අතර, එහිදී එම සීමාවන් ඉක්මවා හෝ වෙනත් කාර්යයක් සඳහා මුදල් වැය කිරීමට සිදුවුවහොත් ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල් හෝ බැංකු හා මුල්‍ය කටයුතු භාර අධ්‍යක්ෂකගේ ලිඛිත අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය වේ. බැංකු සංගමයක් විසින් දරණ කවර ආකාරයේ වියදමක් වුවද ඒ සඳහා සියළුම බිල්පත් සහ පිළිගත හැකි සාක්ෂි සුරක්ෂිතව තැබිය යුතුය.

1.4. සමෘද්ධි බැංකු සංගමයක් විසින් රැස්කරන මුදල් නිදහස් කිරිම හෝ වියදම් කිරීමට අදාල මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ බැංකු හා මුල්‍ය කටයුතු අංශය සතුවන අතර, විවිධ අරමුණු සඳහා සමෘද්ධි බැංකු වල තැන්පත් කර ඇති මුදල් මෙහෙයුම් උපදෙස් වලට පරිබාහිරව වැයකර ඇති බවට අනාවරණය වුවහොත් එය මුදල් අපහරණයක් බැවින්, ඊට සම්බන්ධ සියළුම නිලධාරින්ට විරුද්ධව දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද සඳහන් කරමු.

## 02. සමෘද්ධි ගම්මාන සමිති හා සමෘද්ධි බලකා ගිණුම් හි රැස්කර ඇති මුදල් අයථා ලෙස ලබා ගැනීම.

2.1. සමෘද්ධි බලකා සහ සමෘද්ධි සමිති වල ඉතිරිකිරීමේ ගිණුම් සමෘද්ධි බැංකු සංගම් වල සාමාජික නොවන ගිණුම් වර්ගය යටතේ පවත්වා ගෙන යනු ලබන අතර ඇතැම් සමෘද්ධි බලකා විසින් රජයේ වාණිජ බැංකු වලද සිය ඉතිරිකිරීමේ ගිණුම පවත්වා ගෙන යනු ලබයි. සමෘද්ධි බැංකු සංගමයේ සාමාජික නොවන ගිණුමක් ලෙස බලකා හෝ සමිති ගිණුමක් ආරම්භ කිරීමේදි සමෘද්ධි අධිකාරිය විසින් නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් අංක 01 හා 06 හි සඳහන් අවශ්‍යතාවන් අනුව කටයුතු කර තිබිය යුතු අතර ගිණුමෙන් ගණුදෙනු කිරීමේ කටයුතු ද මෙහෙයුම් උපදෙස් වලට අනුකූලව විධිමත්ව සිදු විය යුතුය.

2.2. සමෘද්ධි බැංකු සංගම් වල පවත්වා ගෙන යනු ලබන සමෘද්ධි බලකා ගිණුම් වලට අයත් ගණුදෙනු කටයුතු සමෘද්ධි බලකා අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව සිදුවිය යුතුය. එම අතුරු ව්‍යවස්ථාවට අනුව මුදල් අයකිරීම් හෝ ගෙවීම් කල හැක්කේ කලාප කමිටුව හා ප්‍රාදේශිය කමිටුවේ අනුමැතිය ලත් කාර්යන්ට පමණක් වන අතර, එම කාර්යන් තම බලකාය අයත් බල ප්‍රදේශයට පමණක් සීමා විය යුතුය. එහෙත් සෑම ගෙවිමක්ම විධායක කමිටුව විසින් ද නිර්දේශ කල යුතුය. විධායක සභිකයන්ගේ වගකිම වන්නේ සමෘද්ධි ව්‍යාපාරයේ පරමාර්ථ , නීතිරීති හා අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව සමෘද්ධිමත් සමාජයක් බිහිකිරීම සඳහා තම කටයුතු හා යුතුකම් බුද්ධිමත් ලෙස ඉටුකිරීමය. එමෙන්ම බලකාය සඳහා පිහිටුවා ඇති උපදේශක කමිටු වේ නිර්දේශද මහ සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බව බලකා අතුරු ව්‍යවස්ථවේ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත.

2.3. සමෘද්ධි බලකා ක්‍රියාත්මක කිරිම සම්බන්ධ පැහැදිලි උපදෙස් , ස/අධි/10/බලකා/2009 හා 2008.12.16 දිනැති අංක 2009/5 දරණ චක්‍ර ලේඛය මගින් දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශිය ලේකම් වරුන් /සහකාර සමෘද්ධි කොමසාරිස් වරු / සමෘද්ධි කළමණාකරුවන්/ සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත ලබාදි ඇත.

2.4. ඉහත දක්වන ලද චක්‍ර ලේඛ මෙහෙයුම් උපදෙස් අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධායන්ට අනුකූල නොවන කරුණක් වෙනුවෙන් බලකා ගිණුම් හි මුදල් ඉවත් කර ගැනීමට සමෘද්ධි සහකාර කොමසාරිස් වරුන් විසින් වරින්වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.එම ඉල්ලීම් ඉහතින් දක්වා ඇති ක්‍රියාපටිපාටින් අනුගමනය නොකර එම නිලධාරින්ගේ අභිමතය පරිදි ඉදිරිපත් කල ඒවා බව වැඩිදුරටත් නිරික්ෂණය වේ.

2.5. එමෙන්ම එක් බලකායකින් තවත් බලකායක් වෙත ණය පදනම මත සිය බලකා ගිණුමෙන් මුදල් ලබාදීමට ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් නිර්දේශ ලබාදී මුදල් නිදහස් කර ඇති බව විගණන පරික්ෂණ වලදී අනාවරණය වී ඇත. මෙම ක්‍රියාවලිය උපදෙස් වලින් බැහැරව සිය බලය ඉක්මවා කටයුතු කිරිමක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

2.6. සමෘද්ධි ගම්මාන සමිති, සමාද්ධි බලකාය ව්‍යවස්ථාවන්ට සහ 2009/05 චක්‍රලේඛනයටත් මේ දක්වා නිකුත් කල මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි හා අභ්‍යන්තර මගපෙන්වීම් වලට පරිබාහිරව, ප්‍රාදේශිය / දිස්ත්‍රික්කයේ විවිධ අවශ්‍යතා සහ අරමුණු වෙනුවෙන්, මෙම ගිණුම්හි මුදල් සමෘද්ධි ගම්මාන සමිති / සමෘද්ධි බලකායේ ප්‍රජාව නියෝජනය කරන නිලධාරීන් නොමග යවා අවිධිමත් ආකාරයට ලබාගෙන ඇති බවට තොරතුරු සමෘද්ධි අධිකාරිය වෙත ලැබී තිබීම.

උදා:- ක්‍රීඩා තරඟ, සංග්‍රහ වියදම් පියවා ගැනීම්, වෙනත් රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉදිකර ඇති ගොඩනැගිලි නැවත ඉදිකිරීම හෝ අළුත්වැඩියාව සඳහා, විවිධ ද්‍රව්‍ය මිලදී ගැනීම්, නිලධාරීන්ට ත්‍යාග ලබාදීම, පිලිගැනීමේ උත්සව සඳහා තොරන් ඉදිකිරීම සහ සංග්‍රහ වියදම් , ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාලයන්හි පැවැත්වෙන විවිධ උත්සව සඳහා වියදම් පියවීම, විවිධ උත්සව සඳහා ප්‍රචාරණ අවශ්‍යතා.

2.7. පොදු දේපලක් ලෙස සැලකිය හැකි සමෘද්ධි බලකා හා සමෘද්ධි සමිති සතු මුදල් නීත්‍යානුකූල නොවන ආකාරයට ඉවත් කර ගැනීමට කටයුතු කිරිම. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනතේ නියමයන්ද 1982 අංක 12 දරණ පොදු දේපල පනතේ නියමයන්ද, ආයතන සංග්‍රහයේ XLVII වෙනි පරිච්ඡේදයේ 5 ඡේදයේ නියමයන්ද මුදල් රෙගුලාසි 101 යටතේ නියමයන්ද උල්ලංගනය කිරිමක් වන බැවින්, ඊට අදාල නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකූලව හා නිත්‍යානුකූලව කටයුතු කල හැකි බවද වැඩිදුරටත් සඳහන් කරමු.

| | | |
|---|---|---|
| කේ.කේ.එල්. චන්ද්‍රතිලක, | සුනන්දා පියසීලි, | ආර්.පී.බී. තිලකසිරි, |
| නි. අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ මුදල් | අධ්‍යක්ෂ ජනරාල්. |
| බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම් | | |